www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපයේ වෘත්තීය සමිති නායකයා කප්පාදු පිලිවෙත්වලට සහාය දෙයි

## European trade union head backs austerity measures

**2010 ජුනි 16**

පසුගිය 11දා අන්තර්ජාල ප්‍රවෘත්ති සේවාවක් වන ඊයූ ඔබ්සර්වර් ප්‍රවෘත්ති සේවයට යුරෝපා වෘත්තීය සමිති බලමන්ඩලයේ (ඊටීයූසී) ප්‍රධාන ලේකම් ජෝන් මොන්ක්ස් දුන් සම්මුඛ සාකච්ඡාවක් යුරෝපයේ දේශපාලන සංස්ථාපිතයේ ප්‍රමුඛ නායකයින් අතර තිරයට පිටුපසින් සිදු කෙරෙන සාකච්ඡාවන් පිලිබඳ හෙලිදරව්කාරී දසුනක් සපයා ඇත.

මහාද්වීපය පුරා ආන්ඩු මගින් ක්‍රියාවට දමමින් සිටින පියවර, 1930 ගනන් කරා ආපසු යාමක තර්ජනය මතු කරන බව සම්මුඛ සාකච්ඡාවේදී යුරෝපීය සමිති නායකයා පැවසී ය. යුරෝපයේ වර්තමාන තත්වය "අතිශය භයානක" බව ඔහු ප්‍රකාශ කලේ ය. "මේ 1931යි, අප මහා අවපාතය සහිත 1930 ගනන්වලට ආපසු ගමන් කරනවා වගේම අප නතරවනු ඇත්තේ මිලිටරි ඒකාධිපතිත්වයෙනි. අප තවමත් එතැනට පැමින සිටින බව මා කියන්නේ නැහැ, නමුත්, ආර්ථික වශයෙන් පමනක් නොව දේශපාලනිකවත් එවැන්නකට ඇති හැකියාව අතිශයින්ම බැරෑරුම්" යයි ඔහු වැඩි දුරටත් පැවසුවේ ය.

ඔහු බෙදාහදා ගන්නේ යුරෝපයේ දේශපාලන ස්ථාවරභාවය පිලිබඳව වෙන කිසිවකු නොව යුරෝපා කොමිසමේ සභාපති ජුසේ මැනුවෙල් බරාසෝගේ ප්‍රකාශිත භීතිය බව මොන්ක්ස් හෙලිදරව් කරයි.

ඊටීයූසී නායකයා හා යුරෝපා සංගමයේ කොන්සර්වේටිව් ප්‍රධානියා අතර පවත්නා සමීප සම්බන්ධතාවය අඟවමින්, මොන්ක්ස් මෙසේ විස්තර කලේ ය: "ග්‍රීසිය, ස්පාඤ්ඤය, පෘතුගාලය සහ අනෙක් රටවල්වලට කුමක් කල හැකි ද යන්න පිලිබඳව පසුගිය සිකුරාදා බරාසෝ සමග සාකච්ඡා කලා. ඔහුගේ පනිවිඩය සෘජුයි: 'බලන්න, ඔවුන් මෙම කප්පාදු පිලිවෙත් ගෙන ගියේ නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් යයි අප දන්නා මාවතෙන් මෙම රටවල් ඇත්තටම අතුරුදහන් වෙනවා. ඔවුන්ට වෙන විකල්පයක් නැහැ. ඔහු බෙහෙවින් කනගාටුවට පත්වුනා. නයගැතිකම නිසා යුරෝපයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්ගේ අනාගත බිඳවැටීම පිලිබඳ දෘෂ්ටියකින් ඔහු අප කම්පාවට පත්කලා."

කප්පාදු පිලිවෙත් ඉදිරියට ගෙන නොගිය හොත් එකම විකල්පය වන්නේ ඒකාධිපතිත්වය පමනක් බව බරාසෝ විසින් දැනුම් දීමෙන් පසුව, යුරෝපා සංගමය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉල්ලා සිටිනු ලබන කෲර පිලිවෙත් සාර්ථකව ක්‍රියාවේ යෙදවීම සහතික කිරීම සඳහා තමන් සතු සියලු බලය යොදා ඕනෑම දෙයක් කරන බව මොන්ක්ස් පැහැදිලිව ප්‍රකාශ කලේ ය.

නය ආපසු ගෙවීම සඳහා යුරෝපා සංගමය හා ජාමුඅ විසින් පනවා තිබෙන කොන්දේසි පිලිගන්නවා හැරෙන්නට - උදාහරනයක් ලෙස දරුනු කප්පාදු වැඩසටහන් ක්‍රියාවේ යෙදවීම හැරෙන්නට - ග්‍රීසිය හා අනෙකුත් යුරෝපීය රටවලට වෙන විකල්පයක් නැති බව මොන්ක්ස් අවධාරනය කරයි.

"ග්‍රීසිය පැහැදිලිවම වෙනස් විය යුතු යි. එය දැඩිවිය යුතුයි. ග්‍රීසියට තිබෙන එකම කොන්දේසිය යුරෝපා සංගමයේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇප කොන්දේසියි. ග්‍රීසියට විකල්පයක් නැත. ඔවුන්ට දුන් දෙයට ඔවුන් අවනත විය යුතුව ඇත." යයි ඔහු ඊයූ ඔබ්සර්වර් වෙත පැවසීය.

මොන්ක්ස්ට අනුව ග්‍රීසියට පවත්නා එකම ඉදිරි මාවත වන්නේ එහි නය ප්‍රතිව්‍යුහගත කිරීමයි. "යුරෝපා සංගමයේ හා ජාමූඅ කොන්දේසි ඉටු කිරීමෙහි ලා හොඳ උත්සාහයක් ගන්නා බව පෙන්නුම් කිරීමයි."

මොන්ක්ස්ගේ මතය අනුව, යුරෝපීය සංගමය හා ජාමුඅ නය ආපසු ගෙවීමේ දරුනු කොන්දේසිවලට එකඟ වීම හැර වෙන "විකල්පයක් ඇත්තේ නැත" යන්නට අඩංගුවන අනෙකුත් රටවල් වන්නේ අයර්ලන්තය, හන්ගේරියාව හා බෝල්කන් රාජ්‍යයෝය.

මොන්ක්ස්ගේ පැහැදිලි කිරීම් එලිමහනට පැමිනි කාලය අර්ථභාරී වේ. එලඹෙන මාසවල ක්‍රියාවේ යෙදවීමට තිබෙන බලගතු කප්පාදු වැඩසටහන් පිලිබඳව බොහොමයක් යුරෝපයේ ආන්ඩු මෑත සතිවලදී නිවේදනය කර තිබේ. මෙම පිලිවෙත් වල පොදු ලක්ෂන වන්නේ වැටුප් හා විශ්‍රාම වැටුප් විශාල

වශයෙන් කප්පාදු කිරීමත්, සමාජ සුබසාධන පද්ධතීන් මත පුලුල් ප්‍රහාරත් එකට බැඳී තිබීමයි.

කප්පාදුවල ප්‍රධාන ඉලක්කය වන්නේ මහාද්වීපයේ ප්‍රමුඛ බැංකු හා මූල්‍ය ආයතනවල සේප්පු තුලට තවදුරටත් මිරිකා ගැනීමට සම්පත් යුරෝපයේ ආන්ඩු විසින් නිදහස් කිරීමයි. යුරෝපයේ දුර්වලම ආර්ථිකයන් සේ සැලකෙන ස්පාඤ්ඤය, ග්‍රීසිය, පෘතුගාලය හා අයර්ලන්තයට ඩොලර් ට්‍රිලියනයකට ආසන්න මුදලක් ප්‍රන්සයේ හා ජර්මනියේ බැංකු මගින් නයට දී තිබූ බව මේ සතිය මුල දී අනාවරනය විය. මෙම අගය විශ්ලේෂයකයන් බලාපොරොත්තු වී තිබුනාට වඩා වැඩි ය. කෙසේ හෝ නය ගෙවා ගැනීමට නොහැකි යුරෝපයේ රෝගාතුර වූ ආර්ථිකයන් ගොන්න හේතුවෙන් බැංකු වලට කෙරෙන අමතර රාජ්‍ය ඇපදීම් නොවැලැක්විය හැකියි.

කප්පාදු පිලිවෙත් දැනටමත් ක්‍රියාත්මක කර ඇති බටහිර හා නැගෙනහිර යුරෝපීය රටවල වැඩවර්ජන හා විරෝධතා මාලාවක් ඇවිලී තිබේ. රාජ්‍ය අංශයේ සියයට 25 ක මහා පරිමාන වැටුප් කප්පාදුවක් හා සියයට 15 ක විශ්‍රාම වැටුප් අඩු කිරීමක් සැලසුම් කර තිබෙන රුමේනියාවේ, ස්ටැලින්වාදී පාලන තන්ත්‍රය බිඳවැටුනායින් පසුව වූ විශාලතම පෙලපාලි මගින් කම්කරු පන්තිය ප්‍රතිචාර දක්වා තිබේ. අඟහාරුවාදා, රාජ්‍ය අංශයේ කම්කරුවෝ තවදුරටත් වර්ජනයේ යෙදෙමින් යෝජිත වැටුප් කප්පාදුවට එරෙහිව බුකාරෙස්ට්වල පාර්ලිමේන්තු ගොඩනැගිල්ල ඉදිරියේ විරෝධතාවල නිරත වූහ.

බ්‍රසල්ස්හි අනතුරු ඇඟවීමේ සීනු නාද කර ඇත්තේ ද මහාද්වීපයේ වෘත්තීය සමිති හා යුරෝපා කොමිෂම අතර කිට්ටු සබඳතාවක් ගොඩනැඟීමට තුඩුදී ඇත්තේ ද යුරෝපයේ බොහොමයක් රටවල කප්පාදු පිලිවෙත්වලට එරෙහිව වැඩකරන ජනතා පුලුල් ස්ථරයකගේ මෙම ව්‍යාපාරයයි.

කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට එරෙහිව එල්ල කරන කුරිරු කප්පාදුවලට විකල්පය ඒකාධිපතිත්වය බවට බරාසෝ කල අනතුරු ඇඟවීමෙන් හැඟෙන්නේ දරුනු මර්දනය හෝ වෘත්තීය සමිති වසා දැමීමයි. කප්පාදුවලට එරෙහි විරුද්ධත්වය බිඳ හෙලීමට වෘත්තීය සමිති නිලධරය සතු සියලු සම්පත් උපයෝගී කර ගන්නා බව දැනුම් දෙමින් යුරෝපයේ ධනපතියන්ට මොන්ක්ස් ප්‍රතිචාර දක්වා තිබේ.

ඉතිහාසය නැවත නැවතත් ප්‍රදර්ශනය කර ඇති පරිදි, රැකියා හා ජීවන තත්වයන් මත ප්‍රහාරයට එරෙහි කම්කරු පන්ති ප්‍රතිරෝධයේ පරාජය ඒකාධිපතිත්වය වලක්වනවා වෙනුවට ඒකාධිපතිත්වයේ ආගමනය සලකුනු කරයි. ධනවාදය අවසන් කර සමාජවාදය ගොඩනැගීමට කම්කරු පන්තියේ විප්ලවවාදී බලමුලු ගැන්වීමකින් පරිබාහිරව ගෝලීය ධනවාදයේ අර්බුදයට "ප්‍රජාතන්ත්‍රවාදී" විසඳුමක් ඇත්තේ නැත. මොන්ක්ස් මෙයට එකහෙලා විරුද්ධ වන අතර ඔහු කතා කරන්නේ සමස්ත ජාත්‍යන්තර වෘත්තීය සමිති වෙනුවෙනි. කම්කරු පන්ති විප්ලවය හා ධනේශ්වර ඒකාධිපතිත්වය අතර තෝරා ගැනීමක දී ඔවුන්ගේ තේරීම දෙවැන්නයි.

1930 ගනන්වලින් පසු ඒකාධිපතිත්වයේ දැවැන්තම අන්තරායට යුරෝපය මුහුන දී සිටින බව පිලිගනිමින්, මොන්ක්ස් ඇඟවුම් කරන්නේ ඊටීයූසී ය හැකිතාක් කල් අත් බැඳගෙන සිටීමට සූදානම්ව සිටින බවයි. යුරෝපයේ කම්කරු පන්තියෙහි කුමන හෝ පුලුල් ක්‍රියාමාර්ගයක් එය ඉවතලයි. ඒ වෙනුවට ඊටීයූසී ය බ්‍රසල්ස් හි පැවැත්වීමට නියමිත යුරෝපා සංගම් මුදල් අමාත්‍යවරුන්ගේ රැස්වීමට සමගාමීව යුරෝපය අලලාගත් "ක්‍රියාවේ දිනයක්," වෙනත් වචනවලින් කියතොත් සාමකාමී උද්ඝෝෂනයක්, සැප්තැම්බර් 29 දාට (තව මාස තුනක කාලයකින්) සැලසුම් කර තිබේ.

එක් දින ක්‍රියාමාර්ගය පලල් වැඩ වර්ජන ක්‍රියාමාර්ගයක් නොවන බවට මොන්ක්ස් නිවේදකයාට සහතික විය. "විවිධ ක්‍රියාකාරකම්වලින් සමන්විත වට්ටෝරුවක කොටසක් ලෙස වර්ජනවලට සහභාගීවන ලෙස අප සමාජිකයන් ධෛර්යමත් කරනවා. නමුත් එය ජෙනරල් ස්ට්‍රයිකයක් නොවේ" මොන්ක්ස් අවධාරනය කලේ ය.

යුරෝපා සංගමය හා ජාමූඅ සමග සහයෝගීතාවය පිලිබඳ මොන්ක්ස්ගේ විවෘත ප්‍රකාශය, කප්පාදුවලට එරෙහි කම්කරුවන්ගේ ප්‍රතිරෝධය වෘත්තීය සමිතිවල අත යට තිබිය යුතුයයි කියා සිටින ප්‍රන්සයේ නව ධනපති විරෝධී පක්ෂය, ජර්මනියේ වාම පක්ෂය, බ්‍රිතාන්‍යයේ සමාජවාදී කම්කරු පක්ෂය, ඉතාලියේ රිෆොන්ඩාසියෝනි කොමියුනිස්ටා, ග්‍රීසියේ සයිරිසා හා ඇන්ටාසියා වැනි සියලුම දේශපාලන සංවිධානවලට එරෙහි බලගතු චෝදනා පත්‍රයක් වන්නේ ය.

පරිපූර්නව දූෂිත, ප්‍රජාතන්ත්‍ර විරෝධී හා දක්ෂිනාංශික සමිති තුලින්, බැංකුකරුවන් හා ඔවුන්ගේ නියෝජිතයන්ට නොඅඩු සතුරෙකුට කම්කරුවෝ මුහුන දී සිටිති.

කප්පාදු වැඩසටහන්වලට එරෙහි බලගතු අරගලයක ආරම්භය වන්නේ, වෘත්තීය සමිති නිලධරයට හා ඔවුන්ගේ සුලු ධනේශ්වර හෙන්චයියන්ට එරෙහිව යුරෝපය පුරා කැරැල්ලක් සහ සමාජවාදය හා බලය සඳහා සටන් කරන කම්කරු පන්තියේ නව ප්‍රජාතන්ත්‍රවාදී සංවිධාන ගොඩනැගීම ය.

ස්ටෙෆාන් ස්ටයින්බර්ග්

© www.wsws.org